සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

12253

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2015


## (i) අවබෝධය

පැ එකයි මිනිත්තු තිහයි

**විභාග අපේක්ෂකයින්ට උපදෙස්**

**ඉතා වැදගත් :**

**පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.**



**ඔබේ විභාග අංකය මෙහි ඇති තිත් ඉර මත ලියන්න.**

..................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

..................................

**වැදගත් :**

- ✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **6** කින් හා ප්‍රශ්න **3** කින් යුක්ත වේ.
- ✳ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.
- ✳ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය **පැය එකයි මිනිත්තු තිහකි.**
- ✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.
- ✳ **දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.**
- ✳ **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
- ✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.
- ✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස **නිල්** හෝ **කළු** පෑනෙන් පමණක් ලියන්න. **පැන්සල් පාවිච්චි නොකරන්න.**
- ✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.
- ✳ **අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 (i) | |
| 1 (ii) | |
| 2 | |
| 3 | |
| එකතුව | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

Find out more details

[ 2 වැනි පිටුව බලන්න.

(iv) විශේෂයෙන් ම, ජනගහන ව්‍යුහයේ සිදු වෙමින් පවතින වෙනස්කම් සහ බෝ වන රෝගවල සිට බෝ නො වන රෝග දක්වා රෝගවල සිදුවන විකාශනය හමුවේ බෝ නො වන රෝග තත්ත්වයන් ඉහළ යෑම හේතුවෙන් ඒ සඳහා සෞඛ්‍ය බලධාරීන්ගේ අඛණ්ඩ අවධානය යොමු වී ඇත. හෘදවාහිනී ආශ්‍රිත රෝග, දියවැඩියාව, පිළිකා සහ නිදන්ගත පෙණහලු රෝග වැනි බෝ නො වන රෝග තත්ත්වයන් හේතුවෙන් මිය යන සංඛ්‍යාව ශ්‍රී ලංකාවේ වාර්ෂික මරණ සංඛ්‍යාවෙන් සියයට 70 කට අධික බව ඇස්තමේන්තු ගත කර ඇති අතර, එම රෝග තත්ත්වයන් රෝගාතුර බව හා ආබාධිත වීමට බලපාන මූලික හේතු ද වේ.

(අ) බෝ වන රෝගවල සිට බෝ නොවන රෝග දක්වා වූ රෝගවල සිදු වන විකාශනය සෞඛ්‍ය බලධාරීන්ගේ අවධානයට පාත්‍ර විය.

(ආ) මේ පාඨයෙහි බෝ නො වන රෝග තත්ත්ව තුනක් ගැන කරුණු දැක්වේ.

(ඉ) ශ්‍රී ලංකාවේ වාර්ෂික මරණ සංඛ්‍යාවෙන් සියයට 70 ක් සිදු වන්නේ බෝ නො වන රෝග නිසා ය.

(ඊ) සෞඛ්‍ය නිලධාරීන්ගේ අඛණ්ඩ අවධානය යොමු වූයේ බෝ නො වන රෝග තත්ත්වයන් ඉහළ යාම කෙරෙහි ය.

..........................................................................................................................

(v) පරිවාස කාල සීමාව තුළ දී, ඉදින් නිලධාරියා ස්ථිර සේවයෙහි රඳවා ගැනීමේ යෝග්‍යතාව පිළිබඳ සැක ඇති වන පරිදි ඔහු කෙරෙහි යම් යම් ගති පැවැතුම් පවත්නා බව පෙනී ගිය හොත් නො පමාව ඔහුට ඒ බව දන්වා අවශ්‍ය දැනමුතුකම් දී ඔහුගේ අඩුපාඩු මගහරවා ගැනීමට හැකි සෑම ආධාරයක්ම දිය යුතු ය. දිගින් දිගට කර ගෙන ගිය හොත් නිලධාරියා සේවයෙහි ස්ථිර කිරීම වැළකී යන අන්දමේ බරපතල ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් හෝ හැසිරීම නොහොත් චරිතය පිළිබඳ කිසියම් දෝෂයක් හෝ ගැන නිලධාරියකුට අවවාද කරන විට එම අවවාද කිරීම ලියවිල්ලකින් කළ යුතු අතර අවවාදය ලැබුණු බවට නිලධාරියාගෙන් අත්සන් ලබා ගත යුතු ය. එසේ කළ යුතු වන්නේ නිලධාරියාගේ අඩුපාඩු ගැන ඔහුට කල්තබා දැනුම් දී එම අඩුපාඩු මගහරවා ගැනීමට ඔහුට අවස්ථාවක් දෙන ලද්දේ ද යන්න ගැන පසුව ප්‍රශ්නයක් පැන නැගීමට ඉඩක් ඇති නො වනු පිණිස ය.

(අ) පරිවාස කාලය තුළ දී නිලධාරියෙකුට අවවාද කළ හැකි අවස්ථා තුනක් මෙහි දැක්වේ.

(ආ) පසුව ප්‍රශ්නයක් පැන නො නගින්නේ නම් ලියවිල්ලකින් තොර ව වුවත් නිලධාරියෙකුට අවවාද කළ හැකි ය.

(ඉ) පරිවාස කාල සීමාව තුළ අදාළ නිලධාරියා කෙරෙහි නිතර ම දැක්විය යුත්තේ විමර්ශනශීලී ආකල්පයකි.

(ඊ) අවවාද කිරීමට අදාළ ලියවිල්ල ලැබුණු බවට නිලධාරියාගෙන් අත්සන් ලබා ගැනීම නිසා කැමති විටෙක ඔහු සේවයෙන් පහ කළ හැකි වේ.

..........................................................................................................................

***

Find out more details

**3.** පහත දැක්වෙන එක් එක් පාඨය අවසානයෙහි ඇති ප්‍රකාශ අතුරින් ඒ පාඨයෙන් පිළිබිඹු වන අදහසට වඩාත් සමීපතම ප්‍රකාශය නම් කරන්න. (නිදර්ශනයක් වශයෙන් (i) පාඨය අවසානයේ දී ඇති ප්‍රකාශ අතුරින් වඩාත් ගැළපෙතැයි ඔබ සිතන්නේ (අ) ප්‍රකාශය නම් ඔබේ පිළිතුර විය යුත්තේ (i) ......(අ) යනු ය.

(i) පළමු වැනි ලෝක යුද්ධය ඇති වූයේ ජාතීන්ගේ "ස්වාධීනත්වය" සඳහා නම්, දෙවැන්න ඇති වූයේ "ප්‍රජාතන්ත්‍රවාදය" සඳහා ය. මෙම මහා අවිගැටුම් දෙකෙහි ප්‍රතිඵල වශයෙන් ඉතිරි වූයේ ජාතිවාදයේ දෙ මුහුණුවර වන "ස්වාධීනත්වය" සහ "ප්‍රජාතන්ත්‍රවාදය" යි. ආසියාවේ මිනිසුන් පිළිබඳ ව නම් ජාතිවාදයේ උන්නතිය මඟින් ඔවුන්ගේ දේශපාලන අපේක්ෂා ප්‍රකාශ විය. ලංකාව ද මේ න්‍යායයෙන් පරිබාහිර වූයේ නො වේ. අපගේ සැලකිල්ලට භාජන වූ මෙම හතළිස් අවුරුද්දෙහි දෙවැනි භාගය තුළ ලංකාවේ දේශපාලනයෙහි ප්‍රධාන බලවේගය වූයේ නැඟී ආ ජාතිවාදයයි.

(අ) පළමු වන හා දෙවන ලෝක යුද්ධ සඳහා ද ජාතිවාදය බලපාන්නට ඇතැයි මේ පාඨය මඟින් උපකල්පනය කෙරේ.

(ආ) ආසියානු රටවල විවිධ ජනවර්ග ජීවත් වන නිසා ඒවායේ ජාතිවාදය නැඟී ඒම පුදුමයක් නො වේ.

(ඉ) ජාතීන්ගේ ස්වාධීනත්වය ඇති වීමත් සමග ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අරගල කිරීම ස්වාභාවික ය.

(ඊ) ලෝක දේශපාලනයෙහි ඇති වන ප්‍රධාන බලවේග තුනක් ගැන තොරතුරු මේ පාඨයෙන් හෙළි වේ.

..............................................................................................................

(ii) ද්විතීයික පාසලෙහි වැඩ ද්විතීයික ලක්ෂණයක් ගන්නේ, පළමු ව ආත්මඥ විචාරය සහ විනිශ්චය නිසා ය. දෙවැනි ව පාසලත් එහි කෙරෙන වැඩත් බාහිර ලෝකයට සම්බන්ධ වී තිබීමෙනි; ශිෂ්‍යයා ද මේ බාහිර ලෝකයට අයත් ය; ඒ ලෝකය අනුක්‍රමයෙන් ඔහුට වඩ වඩා ප්‍රත්‍යක්ෂ වේ. තෙවැනි ව පාසලත් එහි කැරෙන වැඩත් ශිෂ්‍යයන්ගේ අනාගතයත්, එනම්: ඔවුන්ගේ වැඩිහිටි වියෙහි කාර්යයන් වශයෙන් ඔවුන් අවබෝධ කර ගන්නා හෝ ඔවුනට අවබෝධ කරවිය හැකි හෝ කටයුතු අතර සම්බන්ධය නිසා ය. මෙහි දැක්වූ පළමු වැන්නත් ආත්මඥ විනිශ්චයත් අනෙක් දෙකෙන් වර්ග වශයෙන් වෙනස් වෙයි. එමඟින් බුද්ධිය සහ කල්පනා ශක්තිය යොදවා ඉන්ද්‍රියගෝචර භෞතික ලෝකයෙහි ක්‍රමවත් බවක් ඇති කිරීමේ මානසික ක්‍රියාවලියක් විස්තර කරනු ලැබේ. අනෙක් ලක්ෂණ දෙක මඟින් අඩු වශයෙන් ඔවුන්ගේ විචාර බුද්ධිය දියුණුකර ගැනීමට වුවමනා නම් ඒ සඳහා මෙම ක්‍රියාවලිය යෙදිය යුතු ආකාරය විග්‍රහ කර දෙනු ලැබේ.

(අ) ද්විතීයික පාසල යනු ශිෂ්‍යයාට තමා පිළිබඳ අවබෝධය හා විනිශ්චය පමණක් ලබා දෙන ආයතනයකි.

(ආ) පාසලෙහි කෙරෙන වැඩ ශිෂ්‍යයන්ගේ අනාගත ජීවිතයට සම්බන්ධ කිරීම ද්විතීයික පාසලෙහි පෙනෙන සාර්ථක ව්‍යායාමයකි.

(ඉ) ද්විතීයික ලක්ෂණ යටතේ අදාළ මූලික කරුණු තුනක් ගැන තොරතුරු මෙහි ඇතුළත් වේ.

(ඊ) බුද්ධිය හා කල්පනා ශක්තිය යොදවා ඉන්ද්‍රිය ගෝචර භෞතික ලෝකයෙහි ක්‍රමවත් බවක් ඇති කිරීමේ මානසික ක්‍රියාවලිය ශිෂ්‍යයන්ගේ අනාගත ජීවිතයට සම්බන්ධ කිරීම ද්විතීයික පාසලේ එක ම අරමුණයි.

..............................................................................................................

(iii) පල්ලියත් රජයත් හවුල් වී අධ්‍යාපන පහසුකම් සැපයීම ලන්දේසීන් මෙරට ඇති කළ අධ්‍යාපන ක්‍රමය විය. එංගලන්තයේ පැවැති අධ්‍යාපන ක්‍රමය ඊට එකතු කිරීමට වඩා වැඩි යමක් බ්‍රිතාන්‍යයනට කළ නො හැකි විය. පොදු ජනයාට අධ්‍යාපනය දීමේ අවශ්‍යතාව 19 වැනි සියවසේ ආරම්භයේ දී ක්‍රමයෙන් වැටහිණ. පළාත් පාලන ආයතන සහ පුද්ගලයන් එකතු වී සපයන ලද මුදලින් පවත්වා ගෙන ගිය ඉරු දින පාසල් ව්‍යාපාරය සහ පුණ්‍ය පාඨශාලා මඟින් කම්කරු ජනතාවට අධ්‍යාපනයක් දීම ආරම්භ කරන ලදී. සමාජයේ විශාල පිරිසකට අධ්‍යාපනය දෙමින් සමාජ පන්ති වෙන් ව තබා පන්ති භේදයක් උත්සන්න කරන පාසල් ක්‍රමයක් මේ අනුව බිහි විය. මේ ක්‍රමය අනුව ගම්බද පාසල් සහ පුණ්‍ය පාඨශාලා මඟින් සමාජයේ එක් කොටසක අධ්‍යාපන අවශ්‍යතා සපුරා ලන අතර උසස් ශාස්ත්‍රීය පාසල් ධනවතුනට සහ රදළ පන්තියට සීමා විය.

(අ) මෙරට පොදු ජනතාවට අධ්‍යාපනය ලබා දීම සඳහා බ්‍රිතාන්‍යයන් උනන්දු වූ බව පෙනේ.

(ආ) අධ්‍යාපන ආයතන වර්ග තුනක් ගැන තොරතුරු මේ පාඨයෙන් හෙළි වේ.

(ඉ) පන්ති භේදය අනුව බ්‍රිතාන්‍යයන් අධ්‍යාපන ආයතන පවත්වා ගෙන ගියේ එමඟින් රාජ්‍ය පාලනයට පහසුකම් සැලසෙන නිසා ය.

(ඊ) උපකෘත හා අනුපකෘත පාසල් මෙරට ඇති කිරීම බ්‍රිතාන්‍යයන්ගේ අභිප්‍රාය වී ය.

..............................................................................................................

Find out more details

[ 6 වන පිටුව බලන්න.

1. පහත දැක්වෙන පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මුළු මහත් සිංහල ජාතිය සතු ව පැවැති නිර්මාණ ශක්තිය, කලා කෞශල්‍යය සහ කාර්මික ඥානය කෙබඳු වූයේ දැ'යි විදහා දක්වන සංකේතයකි, සීගිරිය. දුටුවන් බිය පත් කරවන පර්වත කූටයක් යවුලින් බිඳ ඒ ගර්භයෙහි සිසිල් දිය පිරි ළිං පොකුණු ආදියෙන් හෙබියා වූ ද විචිත්‍ර චිත්‍ර ශාලාවෙකින් සමලංකෘත වූ ද වාස භවනයක් සහිත බළකොටුවක් තමා රජ කළ වර්ෂ කිහිපය තුළ දී ඉදි කළ කසුප් රජතුමාට අපේ බෞද්ධ සාහිත්‍යයේ සඳහන් විශ්වකර්මයා වුව ද හිස නමා ආචාර කරනු නො අනුමාන ය. කාලයාගේ නිරන්තර උපද්‍රව මතු නො ව විනාශකාරී පුද්ගලයන්ගේ නිහීන ක්‍රියා ද අබිබවා පැවැතෙමින්, ලොව දස දෙසින් පැමිණෙන කලා රසිකයන් විස්මයාකුල අමන්දානන්දයට පත් කරන ලෝක ප්‍රකට සීගිරි ලෙන් සිත්තම් ඇත්තේ එහි එක් චිත්‍රාගාරයෙක ය. සීගිරියේ බටහිර ආගාරයේ කැටපත් පවුරේ සූක්ෂ්ම ලෙස කොටා තිබෙන කුරුටු ලිපි ද එතරම් ම අගනේ ය. සාහිත්‍යයික වටිනාකමින් ද යුක්ත ය. ක්‍රි.ව. 8-10 සිය වස්හි සීගිරිය නැරඹීමට පැමිණියවුන්ගේ සිත් සතන් තුළ ජනිත වූ රස භාවයන් ද විවිධ චින්තා ද මේ ලිපිවලින් කාලයා පරයමින් වාර්තා කැරෙයි. පවුරු තලය මත සියුම් සේ සටහන් කොට ඇති මේ ගී එදා ලක්දිව පොදු ජනයා අතර පැවැති සිතුම් පැතුම් සහ අධ්‍යාපන තත්ත්වය මොනොවට විදහා පායි. සිංහල භාෂාවේ අක්ෂරවල වර්ධනය හඳුනා ගැනීමට ද මහෝපකාරී වන මේ කුරුටු ලිපි අතර සීගිරි ලෙන් සිත්තම්වල සුන්දරත්වයෙන් උදම් වූවන්ගේ ද සිංහ වාසලෙහි අසිරියෙන් කුල්මත් වූවන් ගේ ද සිතිවිලි පමණක් නො ව අන්‍යයන් විසින් කරන ලද පූර්ව ලිපිවලට පිළිතුරු වශයෙන් කරන ලද සටහන් ද ඇත. සුන්දරත්වය පසක් කර විඳුමෙහි සමත් රසඥ බලයක් ද සුගම වාක් ශක්තියක් ද අවශ්‍ය මොහොත පැමිණි විට කිවි පද බැඳුමෙහි දස් කමක් ද හෙළි කරන මේ කුරුටු ලිපි පුරාණ සිංහලයාගේ පොදු උගත්කමේ තත්ත්වයට මෙන් ම ආදියෙහි සිට පැවැත ආ සාරගර්භ සාහිත්‍ය සම්ප්‍රදායකට ද දෙස් දෙන්නකි.

(අ) සීගිරියේ ශ්‍රේෂ්ඨත්වය විදහා දැක්වීමේ දී මේ ලේඛකයාගේ අවධානය යොමු කෙරෙන විවිධ අංශ කවරේ ද?

..........................................................................................................

..........................................................................................................

(ආ) සීගිරි කුරුටු ලිපිවල වස්තු විෂය සඳහා පාදක වී ඇත්තේ කෙබඳු කරුණු ද?

..........................................................................................................

..........................................................................................................

(ඉ) සීගිරි කුරුටු ලිපි මගින් හෙළි කෙරෙන විශේෂ ලක්ෂණ මොනවා ද?

..........................................................................................................

..........................................................................................................

(ඊ) සීගිරියේ පවත්නා ආගාරවල සුවිශේෂත්වය කුමක් ද?

..........................................................................................................

..........................................................................................................

(උ) කසුප් රජතුමාට විශ්වකර්මයා පවා හිස නමා ආචාර කරනු ඇතැයි මේ ලේඛකයා පවසන්නේ කවර හේතුවක් නිසා ද?

..........................................................................................................

..........................................................................................................

Find out more details

[ 3 වන පිටුව බලන්න.

(ii) ජේසුයිට්වරුන් විසින්, පූජක වරයකු යටතේ පාලනය වූ මූලික, ද්විතීයික, උසස් යන අංශ තුනකින් සමන්විත වූ මනාව සංවිධානය කරන ලද පාසල් පිහිටුවන ලදී. ඉගැන්වීමේ මාධ්‍යය වශයෙන් මවු බසෙහි ඇති වටිනාකම ඔවුහු අවබෝධ කර ගත්හ. චාරිත්‍ර ධර්ම ඉගැන්වීමට අමතර ව එම පාසල්වල මූලික අධ්‍යාපනයෙන් කියවීම, ලිවීම සහ ගායනය මවු බසින් උගන්වන ලදී. එතාවත් ඈ ආගමික කටයුතු සඳහා කාව්‍යයේ සහ සංගීතයේ ඇති වැදගත්කම ඔවුහු වටහා ගත්හ. බයිබලයේ කතාවල එන අවස්ථා, උත්සව දිනයන්හි දී ළමයින් ලවා දේවස්ථානවල රඟ දක්වන ලදී. ජේසුයිට්වරුන් දිවයිනේ අධ්‍යාපන කටයුතුවල යෙදීම නිසා අධ්‍යාපන පහසුකම්වල දියුණුවක් ඇති විය. මෙලෙස හැම අධ්‍යාපන ආයතනයක් ම කතෝලික පල්ලිය ආශ්‍රය කර ගෙන ඇති වූ නිසා ඒවා කෙළින් ම ආගමික බලධරයන් විසින් පාලනය කැරුණේ ය.

හැම 'පැරිෂ්' ප්‍රදේශයෙක ම සිටි ළමයිනට මූලික අධ්‍යාපනයක් ලබා දුන් අතර වැඩි වශයෙන් ම පෘතුගීසි සිවිල් සහ යුද්ධ නිලධරයන්ගේ ළමයින් උදෙසා ද සිංහල ප්‍රධානයන්ගේ ළමයින් උදෙසා ද ද්විතීයික අධ්‍යාපනයක් වී ය. ආගම ධර්මයට අමතර ව කියවීම, ලිවීම, මානව විෂයයන් සහ අලංකාර ශාස්ත්‍රය ද්විතීයික පාසල්වල විෂය මාලාවට අයත් විය. ආගමික පොත්පත් ඉගෙනීමට සහ උසස් අධ්‍යාපනය සඳහා ලතින් භාෂාව අවශ්‍ය වූ හෙයින් යුරෝපයේ මෙන් ම මෙහි පාසල්වල ද ලතින් භාෂාව ඉගැන්වීම කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්විණි. ද්විතීයික අධ්‍යාපනය නිම කළ ශිෂ්‍යයන් අතුරින් පූජකවරුන් වීමට අපේක්ෂා කළවුනට පූජකවරුන් පුහුණු කරවන මධ්‍යස්ථානයකට බැඳී ආගම ධර්මය පිළිබඳ ව උසස් අධ්‍යාපනයක් ලබා ගත හැකි විය. කෙසේ වුව ද රාජ කුමාරයනට ඉගැන්වීම ප්‍රැන්සිස්කන්වරුනට භාර විය. රජ කුමරකු විසින් දත යුතු වූ අන්‍ය ශාස්ත්‍රාදියට අමතර ව, පෘතුගීසි, ලතින්, ඉතාලි යන භාෂා ද ඔවුනට උගන්වන ලදී.

(අ) මූලික පාසල්වල උගන්වන ලද විෂයයන් මොනවා ද?

..............................................................................................................................

..............................................................................................................................

(ආ) උසස් අධ්‍යාපන ආයතනවල පැවැති විෂය ධාරාව කෙබඳු වී ද?

..............................................................................................................................

..............................................................................................................................

(ඉ) ද්විතීයික අධ්‍යාපනය හා විෂය මාලාව සකස් වී තිබුණේ කවර අභිමතාර්ථ සපුරා ගැනීම උදෙසා ද?

..............................................................................................................................

..............................................................................................................................

(ඊ) දිවයිනේ අධ්‍යාපන පහසුකම්වල දියුණුවක් ඇතිවීම කෙරෙහි බලපෑ හේතුව වශයෙන් මෙහි දක්වා ඇත්තේ කුමක් ද?

..............................................................................................................................

..............................................................................................................................

(උ) ජේසුයිට්වරුන් විසින් පිහිටුවන ලද පාසල්වල වර්ගීකරණය සිදු වූයේ කෙබඳු ආකාරයෙන් ද?

..............................................................................................................................

..............................................................................................................................

Find out more details

12253

**2.** පහත සඳහන් පාඨය වචන **70** ක් පමණ වන සේ ඔබේ වචනවලින් සාරාංශ කොට ලියා ඊට සුදුසු මාතෘකාවක් ද යොදන්න. සාරාංශයේ අග ඔබ යෙදූ වචන ගණන සඳහන් කරන්න.

නිලධාරින් විසින් විෂය මාලාවේ ඇති කරන ලද සුළු සංශෝධන අධ්‍යාපනික ව ඉතා උසස් වූ නමුත් මහජන ඉල්ලීම අනුව පසු ව ඇති කරන ලද විශාල සංශෝධන හා සසඳා බලන විට එතරම් සැලකිය යුතු නො විය. ජාතික උන්නතියට අනුකූල ව දේශීය සංගීතය, නැටුම්, චිත්‍ර සහ ශිල්ප, මේ රටේ ඉතිහාසය හා භූගෝල විද්‍යාව ඉගැන්වීම කෙරෙහි වැඩි අවධානයක් යොමු විය. තම දරුවනට ඉංග්‍රීසි ඉගැන්විය යුතු බවට මහජන ඉල්ලීම් වැඩිවත් ම රට හැම තැන ම කුඩා නගරවල පවා වැඩි වැඩියෙන් ඉංගිරිසි පාසල් ඇති විය. විෂය මාලාව අතින් බලන විට මෙසේ ඇති වූ නො දියුණු ඉංගිරිසි පාසල් වඩාත් ළං වූයේ සංවිධිත පැරණි ඉංගිරිසි පාසල්වලට නො ව ස්වභාෂා පාසල්වලට ය. මේ පාසල්වල විද්‍යාව හා පැරණි සම්භාව්‍ය භාෂා ඉගැන්විණි. ඒවායේ ශිෂ්‍යයෝ විශ්වවිද්‍යාලයට ඇතුළු වීමට හෝ උසස් රැකියා ලබා ගැනීමට හෝ බලාපොරොත්තු නො වූ අතර තරමක ඉංගිරිසි දැනීමක් අවශ්‍ය වූ ලිපිකාර සහ වෙනත් මධ්‍යම පන්ති රැකියාවක් ලැබීමෙන් තෘප්තියට පත් වූහ. රජයේ මධ්‍ය විද්‍යාල ආරම්භ කිරීම, වැඩි වැඩියෙන් ඉංගිරිසි පාසල් අවශ්‍ය යැයි මහජන උද්ඝෝෂණයේ ප්‍රතිඵලයකි. කෙසේ වෙතත් මේ පාසල් ආරම්භ කිරීමෙන් ශාස්ත්‍රීය ඉංගිරිසි අධ්‍යාපනයක් පමණක් නො ව ගම්බද සිසුනට ප්‍රායෝගික අධ්‍යාපනයක් ද දීමට පුළුවන් වෙතියි රජය අදහස් කළේ ය. ඒ කෙරෙහි මහත් පරිශ්‍රමයක් දැරුව ද මෙයින් දෙවැනි බලාපොරොත්තුව ඉෂ්ට නො වී ය. දිවයිනේ නගර කීපයක ම පිහිටුවා ඇති, පහසුකම් සහිත රජයේ මේ මධ්‍ය විද්‍යාල නොයෙක් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවේ යෙදවීම සඳහා උපයෝගි කර ගන්නා ලදී.

[ 5 වන පිටුව බලන්න.

Find out more details

12253

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියට බඳවා ගැනීම සඳහා වන
සීමිත තරග විභාගය - 2015


## (ii) පාසල් පරිපාලනය පිළිබඳ සිද්ධි අධ්‍යයනය

පැය දෙකයි

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

**ඉතා වැදගත් :**

**පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.**



**ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන පිටුවෙහි ඇති තිත් ඉර මත ද ලියන්න.**

.......................................

නිවැරදි බවට නිරීක්ෂකගේ
කෙටි අත්සන

.......................................

**වැදගත් :**

- ✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **8** කින් හා ප්‍රශ්න **4** කින් යුක්ත වේ.
- ✳ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.
- ✳ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය **පැය දෙකකි.**
- ✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.
- ✳ **දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.**
- ✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.
- ✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස **නිල්** හෝ **කළු** පෑනෙන් පමණක් ලියන්න. **පැන්සල් පාවිච්චි නොකරන්න.**
- ✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.
- ✳ **අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 (i) | |
| 1 (ii) | |
| 2 (i) | |
| 2 (ii) | |
| 3 | |
| 4 (i) | |
| 4 (ii) | |
| 4 (iii) | |
| එකතුව | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

Find out more details

[ 2 වැනි පිටුව බලන්න.

- අංක **1** සිට **4** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධි/අවස්ථා මත පදනම් වේ.

1\. නගරසිරි මහා විද්‍යාලය නාගරික පරිසරයක පිහිටා ඇති 1ඒබී (1AB) වර්ගයේ පාසලකි. 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා පන්ති පැවැත්වෙන එහි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2000 කට ආසන්නය. ගුරු මණ්ඩලය 100 කි. සිසුන්ගෙන් වැඩි පිරිසක් නගරය හා ඒ අවට පදිංචි මධ්‍යම පන්තික හා නගරයේ වැඩ කරන කම්කරු පන්ති පවුල්වලින් පැමිණෙන්නෝ ය.

විදුහල්පති සරණපාල මහතා ඈත ප්‍රදේශයක සේවය කර විශ්‍රාම යාමට ආසන්නව මෙම විදුහලට පැමිණි කෙනෙකි. ඔහු තමාගේ වාසය සඳහා නිවසක් තනා ගෙන යන බැවින් සිය පූර්ණ අවධානය පාසල කෙරෙහි යෙදවීමට අපොහොසත් විය. රාජකාරි කටයුතු බොහොමයක් ඉටු කළේ නියෝජ්‍ය විදුහල්පති සහබන්ධු මහතා විසිනි.

සරණපාල මහතාගේ විශ්‍රාම යාමෙන් අනතුරුව එහි විදුහල්පති ධූරයට ප්‍රදේශයේ ප්‍රධාන පෙළේ පාසලක නියෝජ්‍ය විදුහල්පති ධූරය දැරූ සූරධීර මහතා පත් කරන ලදී. සහබන්ධු මහතා ද විදුහල්පති ධූරය බලාපොරොත්තු වූ නමුත් ඒ පිළිබඳව බලධාරීන් හමුවී කරුණු ඉදිරිපත් කිරීමට ශක්තියක් ඔහුට තිබුණේ නැත.

අනාගත අභිලාෂ රැසක් ඇතිව පැමිණි සූරධීර මහතා පාසල දියුණු කිරීමේ අධිෂ්ඨානයෙන් වැඩ ආරම්භ කළේය. ගුරුවරුන්ගෙන් සෑහෙන පිරිසක් ප්‍රමාදවී පැමිණෙන බැවින් පළමු ගුරු රැස්වීමේ දී ම ඔහු පාසල ආරම්භ කිරීමට ප්‍රථමයෙන් සියලු ම ගුරුවරුන් පාසලට පැමිණිය යුතු බැව් දැන්විය. එමෙන්ම සෑම ගුරුවරයෙකුම සතියකට දිනක් හෝ දෙකක් සවස් වරුවේ පාසලේ රැඳී සිට සිසුන්ගේ විෂය සමගාමී ක්‍රියාකාරකම් අධීක්ෂණය කළ යුතු බැව් ද දැන්විය. ඊළඟ දිනයේ සිට පෙ.ව. 7.30 ට අත්සන් ලේඛනයේ රතු ඉර ලකුණු කිරීමත් පෙ.ව. 8.30 ට රතු ඉරි දෙකක් ලකුණු කිරීමත් ආරම්භ කරන ලදී. පැය ½ කට වඩා ප්‍රමාද වන ගුරුවරුන්ගෙන් ප්‍රමාදවන කාලයට සමාන වන දින ගණනක් අනියම් නිවාඩුවලින් හිලව් කරන බැව් ද දන්වන ලදී.

ප්‍රමාදවී පැමිණෙන සිසුන් ද විදුහල්පතිවරයා හමුවට පමුණුවන ලෙස දන්වන ලදී. පාසල් වේලාවේ දී පවා ඇතැම් සිසුන් අසල පිහිටි කඩයකට ගොස් තේ බීමට පුරුදුව සිටි නිසා පාසල් කාලය තුළ දී සිසුන්ට පාසලෙන් පිටවී යාම ද තහනම් කරන ලදී. සිසු විනය ශක්තිමත් කිරීම සඳහා විදුහල්පතිවරයා විනය නීති මාලාවක් ද පැනවීය.

වීරබාහු හා රණපාල යන ගුරු මහත්වරු ඊළඟ ගුරු රැස්වීමේ දී විදුහල්පතිවරයාගේ ක්‍රියාකලාපයට විරෝධය දැක්වූහ. ප්‍රමාදවී පැමිණිය ද තම විෂයයන්ගෙන් ඉහළ ප්‍රතිඵල ලබා දෙන මෙම ගුරුවරුන් දෙදෙනා උසස් පෙළ සිසුන් අතර ජනප්‍රිය අය වෙති. එහෙත් තමාගේ උපදෙස් නොපිළිපදින ගුරුවරුන් තම ගුරු මණ්ඩලයේ තබා ගත නොහැකි යැයි තීරණය කළ විදුහල්පතිවරයා මේ දෙදෙනා මාරු කරන ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට දැන්විය. ඒ අනුව ඔවුන් වෙනත් පාසලකට මාරු කරන ලදී. ඊළඟ සඳුදා දින පාසල ආරම්භ කළ විගස අදාළ පන්තිවල සිසුහු පන්ති වර්ජනයෙහි යෙදුණහ. දක්ෂ ගුරුවරුන් මාරු කිරීමටත් විදුහල්පතිවරයාගේ දරදඬු පාලනයටත් විරුද්ධ සටන් පාඨ ඇතුළත් පුවරු ද ඔවුහු ප්‍රදර්ශනය කළහ. ගුරු මණ්ඩලයේ සාමාජිකයෝ ද උදාසීනව බලා සිටියහ. අසරණ වූ විදුහල්පතිවරයා තමාට වැරදුණේ කොතන දැ'යි කල්පනා කරන්නට විය.

Find out more details

[ 3 වැනි පිටුව බලන්න.

මෙම සිද්ධියට/අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර දී ඇති **හිත් ඉරි මත** ලියන්න.

(i) අභිනවයෙන් පත්වූ විදුහල්පති සූරධීර මහතාගේ ක්‍රියා පිළිවෙතෙහි අඩුපාඩුකම් **තුනක්** දක්වන්න.

(අ) ..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(ආ) ..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(ඉ) ..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

*(ලකුණු 15 යි)*

(ii) විදුහල්පති සූරධීර මහතා ඉවත් කර නගරසිරි විද්‍යාලයේ විදුහල්පති ධුරයට ඔබ පත් කළහොත් දැනට පාසල තුළ පවතින අයහපත් වාතාවරණය සමනය කිරීම සඳහා ඔබ ගන්නා ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) ..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(ආ) ..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

*(ලකුණු 10 යි)*

Find out more details

[ 4 වැනි පිටුව බලන්න.

(ii) වක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට පෙර විදුහල්පතිවරයාට ගත හැකි පියවර තුනක් පැහැදිලි කරන්න.

(අ) ..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

(ආ) ..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

(ඇ) ..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

*(ලකුණු 15 යි)*

3. සඳසිරිපුර විද්‍යාලය නගරයේ පහසුකම් අඩු ප්‍රදේශයක පිහිටි 1සී (1C) වර්ගයේ මහා විද්‍යාලයකි. සිසුන් 1500 ක් පමණ සිටින එම පාසලේ ගුරු මණ්ඩලය 80 ක් වේ. සිසුන්ගෙන් වැඩි පිරිසක් නගරයේ වෙළෙඳ ආයතනවල හා කර්මාන්ත ශාලාවල වැඩ කරන පවුල්වලින් පැමිණෙන අය වෙති.

පාසල සඳහා අක්කර තුනක පමණ ඉඩමක් තිබේ. ශිෂ්‍ය සංඛ්‍යාව සඳහා ප්‍රමාණවත් ගොඩනැගිලි තිබුණ ද බොහෝ කාලයක් තිස්සේ ඒවා අලුත්වැඩියා කර නොමැති හෙයින් ජරාවාස වී ඇත. මේස හා පුටු කැඩී ඇති හෙයින් ළමයින්ට ප්‍රමාණවත් මේස හා පුටු සංඛ්‍යාවක් නොමැත. වැසිකිළි පද්ධතිය අබලන් වී ඇත. ජලනළ පද්ධතිය නඩත්තු නොකිරීම නිසා ජලය අපතේ යයි. ක්‍රීඩාපිටිය සඳහා අක්කර 1½ පමණ ඉඩමක් වෙන් කර තිබුණ ද එහි වැඩි කොටසක් වල්බිහිවී ඇත. පාසලේ ඉඩම වටා තාප්පයක් හෝ වැටක් නොමැති බැවින් ගවයන් පමණක් නොව නගරයේ නැසිරෙන ඇතැම් පුද්ගලයන් ද සවස් කාලයේ දී පාසලට පැමිණ එහි කාලය ගත කිරීම සිදු වේ. පාසලේ ගුරු නිවාස නොමැති අතර විදුහල්පතිවරයා ද පදිංචිව සිටින්නේ කුලී නිවසක ය.

මෙම පාසලට මාස කිහිපයකට පෙර පත්ව ආ නව විදුහල්පතිවරයා පාසල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සැලැස්මක් සකස් කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළේය. එහි මුළු වියදම රුපියල් මිලියන 2½ කි. දැනට ප්‍රතිපාදන නොමැති හෙයින් මුළු මුදල ලබාදීමට නොහැකි බවත් මිලියන 1½ ක් පමණ රජයේ අරමුදල්වලින් ලබාදිය හැකි බවත් ඉතිරිය පාසල මගින් සපයා ගත හැකි නම් ව්‍යාපෘතිය අනුමත කළ හැකි බවත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විදුහල්පතිවරයාට දැන්වී ය.

Find out more details

[ 6 වැනි පිටුව බලන්න.

මෙම සිද්ධියට/අවස්ථාවට අනුව පහත ප්‍රශ්නයට නිවැරදි පිළිතුර දී ඇති **තිත් ඉරි මත** ලියන්න.

ඔබ එම විද්‍යාලයේ විදුහල්පතිවරයා නම් අවශ්‍ය මුදල් ප්‍රමාණය සපයා ගන්නා ක්‍රම **පහක්** සැකෙවින් පැහැදිලි කරන්න.

(i) ..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

(ii) ..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

(iii) ..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

(iv) ..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

(v) ..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

*(ලකුණු 05 × 5 = 25 යි)*

Find out more details

[ 7 වැනි පිටුව බලන්න.

4. මානදී මහා විද්‍යාලය මහවැලි කලාපයේ ගොවි ජනපද කිහිපයක වාසය කරන ජනතාවගේ දරුවන් සඳහා පිහිටුවා ඇති ද්විතීයික පාසලකි. එහි සිටින ගුරුවරුන්ගෙන් වැඩි පිරිසක් විශ්ව විද්‍යාලවලින් හෝ අධ්‍යාපන විද්‍යා පීඨවලින් පිටවී පළමු පත්වීම ලබාගත් තරුණ වයසේ අය වූහ.

ප්‍රේමසාගර මහතා එසේ පැමිණි උපාධිධරයෙකි. ඔහු මේ පාසලට පැමිණ අවුරුදු දෙකක් පමණ වේ. තරුණ ගුරුවරයෙකු වශයෙන් 12, 13 ශ්‍රේණිවල භූගෝල විද්‍යාව හා ඉතිහාසය විෂයයන් ඉගැන්වූ ඒ මහතා උනන්දුවෙන් තම ඉගැන්වීමේ කටයුතු කර ගෙන ගිය, සිසුන් අතර ද පිළිගැනීමක් ඇති උද්‍යෝගිමත් ගුරුවරයෙකි.

මංගලා ප්‍රියදර්ශනි මෙනවිය මේ වර්ෂයේ අධ්‍යාපන විද්‍යා පීඨයකින් පිටවූ විද්‍යා ගුරුවරියකි. ඇය තරමක් දඟකාරී බවක් පෙන්වූව ද තම ඉගැන්වීමේ කටයුතු අතපසු නොකර රාජකාරියෙහි යෙදෙන්නියකි.

ගුරු විවේකාගාරයෙහි දී මේ දෙදෙනා බොහෝවිට සතුටු සාමීචියෙහි යෙදුණු අතර ක්‍රමයෙන් එය ප්‍රේම සම්බන්ධතාවක් බවට පත්විය. ඔවුහු ගුරු විවේකාගාරය වෙනුවට රසායනාගාරයේ ගබඩා කාමරයට ගොස් කාලය ගත කිරීමට පටන් ගත්හ. බොහෝ දිනවල පාසල් වේලාවෙන් පසුව ද පැය ගණනක් ඔවුහු එම කාමරයේ ගත කළහ. මේ නිසා ගුරු මණ්ඩලය මෙන්ම සිසුන් අතර ද මේ සබඳතාව ගැන කසුකුසු ඇති විය. සමහර විටෙක නියමිත පන්තිවලට යාම පවා ඔවුහු අතපසු කළහ. සති අන්තවල දී දෙදෙනාම ගෙදර යන බව පවසමින් විනෝද චාරිකාවල යෙදෙන බවට ද කටකතා පැතිරිණ. මේ තත්ත්වය විදුහල්පතිවරයාගේ කණට ද වැටිණි.

දිනක් පාසල් ගේට්ටුව අසල මේ දෙදෙනාගේ හැසිරීම පිළිබඳව සඳහන් කර පෝස්ටරයක් අලවා තිබිණි. මේ දෙදෙනාගේ හැසිරීම අශෝභන බවත් ඔවුන් වැඩිහිටි සිසුන්ට නරක ආදර්ශයක් දෙන බවත් විදුහල්පතිවරයාට නිර්ණාමික ලිපියකින් දන්වා තිබුණි. ජ්‍යෙෂ්ඨ ගුරුවරු කිහිප දෙනෙක් ද විදුහල්පතිවරයා සමග මේ පිළිබඳව සාකච්ඡා කර යම්කිසි පියවරක් ගතයුතු බව සඳහන් කළහ.

මෙම සිද්ධියට/අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර දී ඇති **තිත් ඉරි මත** ලියන්න.

(i) විදුහල්පතිවරයා විසින් මේ දෙදෙනාට උපදෙස් දීමේ ක්‍රියාවලිය සංවිධානය කර ගත යුත්තේ කෙසේ ද?

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

*(ලකුණු 05 යි)*

Find out more details

(ii) එසේ උපදෙස් දීමේදී ඒ දෙදෙනාට කරුණු පහදා දෙන ආකාරය විස්තර කරන්න.

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

*(ලකුණු 10 යි)*

(iii) ඉදිරියේ දී මෙවැනි සිදුවීම් පාසල තුළ ඇතිවීම වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග මොනවා දැයි කෙටියෙන් විස්තර කරන්න.

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

*(ලකුණු 10 යි)*

* * *

Find out more details